ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2013

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ගරු ගාමිණී ලොකුගේ**

අමාත්‍යතුමා - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**ගරු සරත් වීරසේකර**

නියෝජ්‍ය අමාත්‍ය - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**ඩබ්ලිව්.ජේ.එල්.යු. විජයවීර**

ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**වෛද්‍ය එන්.සී. අමරසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**විගණන කමිටුව**

**වෛද්‍ය එන්.සී.අමරසිංහ** - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**සී.සේනානායක -** සභාපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

**ඩබ්ලිව්.ඩී.බී.ජේ. වැලිවත්ත** - නිරීක්ෂක, විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව

**ඊ.ඩබ්ලිව්.ඒ.ජී.පුන්‍යසිරි** - අභ්‍යන්තර විගණක, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**පී.එම්.කේ.පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**බැංකුව-** මහජන බැංකුව - නාරාහේන්පිට

## පටුන.........................................


පිටුව

01 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිළිබඳ හැඳින්වීම 03

02 දැක්ම, මෙහෙවර, අරමුණු 04

03 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ කාර්යයන් 05

04 කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ පණිවිඩය 06

05 ලේකම් තුමාගේ පණිවිඩය 07

06 අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ පණිවිඩය 08

07 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් **13**

08 2013 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා , වැඩමුළු හා සම්මන්ත්‍රණ 14

- **පාඨමාලා**
  - වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව. 14-15
  - වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 15
  - කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම. 16
  - වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය 16-17
- **රෝග නිර්ණ කඳවුරු 18-19**
- **මෙම වසරේ පවත්වන ලද පුහුණු වැඩමුළු**
  - කොළඹ ප්‍රදේශය මූලික කරගෙන පවත්වන ලද අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන. 21
  - බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම. 21
  - කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යාන වැඩසටහන. 23-23
  - අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන. 23
  - වාර්ෂික ප්‍රදර්ශනය. 23-24
  - වෙබ් අඩවිය එළිදැක්වීම. 24
  - වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සමුළුව. 25-26
  - මාධ්‍ය හමුව. 26
  - සහතිකපත් ප්‍රදානෝත්සවය. 28
- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය සඳහා වූ පුස්තකාලය. 28**
- **2013 වර්ෂයේදී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් පාරිසරික මිනුම් හා වෘත්තිය සුරක්ෂිතතාව සඳහා සේවාවන් ලබාගත් ආයතන. 29-30**
- **මූල්‍ය විශ්ලේෂණය මූල්‍ය ප්‍රකාශනය 31-33**
- **ගිණුම්වලට අදාල සටහන් -වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 34-36**
- **විගණකාධිපති වාර්තාව 37-41**

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## හැඳින්වීම

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිලිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදි. මෙරට තුල මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිලිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්වයක් සැම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද අප විසින් ලබාදෙනු ලබයි.

ආයතනයක් ලෙස අප ඉහත කාර්යන් සියල්ලක්ම ඉතාමත් සාර්ථක ලෙස ඉටු කරමින් අපගේ පාරිභෝගික ජනතාව හට ඉහල තෘප්තියක් මෙන්ම වඩා ඵලදායි සේවාවන් ලබාදෙන බවට ඉතාමත් සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු. ඒ පිලිබඳව වඩාත් සතුටු විය හැකි ප්‍රබල හේතුව වන්නේ මෙම ආයතනය ආරම්භ කර ඉතාමත් කෙටි කලකදි වුවද ලබා ඇති දියුණුවේ ප්‍රගතිය දෙස බැලීමේදීය. එසේම මේ වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙන් නිරතුරුවම සේවා ලබාගන්නා ආයතන ප්‍රමාණය දෙස බලා කරන ලද පසු විපරම තුළින් මෙය වඩාත් ඔප්පු කර ගත හැකි වනු ඇත.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයට ඉතාම කෙටි කාලයකින් මෙරට අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ඇති බොහෝ කාර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි මනක් ආනයන අපනයන සමාගම් සමඟ මෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමාගම් හා වැවිලි ක්ෂේත්‍රයේ සමාගම් සමඟ අපගේ සේවා කටයුතු සිදු කරමින් ඉතා වටිනා කාර්යයභාරයක් ඉටු කර ඇත. එම ආයතනයන් සමඟ එක්ව ඒ ඒ ආයතනවල වැඩ කරන සේවකයන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා විවිධ වැඩසටහන්, දැනුවත් කිරීම් රාශියක් පසුගිය කාලයන්හි සිදු කොට ඇත්තෙමු. මෙම වසරේදීද අපගේ සේවා කටයුතු ඉහල මට්ටමකට ගෙන ඒමට මහත් කැපවීමෙන් කටයුතු කළ අතර ඒ පිලිබඳව හා මෙම වසර තුල අපගේ සේවාවන් පිලිබඳ සමාලෝචනය මෙහි ඇතුලත්වේ.

## දැක්ම

*"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"*

## මෙහෙවර

*"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින්*

*ත්‍රෛයිපාර්ශවීය*

*කොටස් කරුවන් සවිබලගැන්වීම."*

## අරමුණු

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියන් සැකසීමේ සියළු ක්‍රියාකාරකම් වලදි අදාල අමාත්‍යවරයාට සහය වීම**
- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේදී අවශ්‍ය වන අධ්‍යන පර්යේෂණ සහ විශ්ලේෂණ සිදු කිරීම**
- **වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍ය සහ සුබසාධනය පිලිබඳ අධ්‍යාපනය, පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ කාර්යයන්

- සේවකයන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස අදාළ පර්යේෂණ හා අධ්‍යයන සිදුකොට භාවිතයට ගන්නා යන්ත්‍රසූත්‍ර වල තත්වය වැඩි දියුණු කිරීම, නිසි ප්‍රමිතියෙන් යුතු ආරක්ෂිත ආවරණ නිර්මාණය මෙන්ම සෑම විටම ආරක්ෂිත ආවරණ සහිත යන්ත්‍රසූත්‍ර භාවිතයට ,සේවකයින් පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතයට යොමු කිරීම සඳහා අදාල සුරක්ෂිත ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම.

- අදාල පර්යේෂණ හා සංවර්ධන සිදු කර, සේවා ස්ථානයේ, වැඩබිම්වල ශබ්ද මට්ටම, ආලෝක මට්ටම, දූවිලි මට්ටම, තාපය හා ආර්ද්‍රතා මට්ටම ආදී පාරිසරික සාධක අධීක්ෂණය හා ඒවා සේවකයින්ගේ සෞඛ්‍යයට හිතකර තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, වැඩකරන තත්වවල ඇති හානිදායක බව නැති කිරීම හෝ අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම.

- සේවකයින්ගේ වැඩකරන සේවක ඉරියව්ව, ශ්‍රම විද්‍යානුකූලව නිවැරදි කිරීමට සේවකයින්ගේ දැනුවත් කිරීම හා එම කටයුතු සඳහා භාවිතා කරන උපකරණ සේවකයට ගැලපෙන අයුරින් සැපයීම සඳහා සේවායෝජකයින් යොමු කිරීම.

- සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා සුදුසු ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම.

- වැඩ පරිසරය නිරීක්ෂණය කර උසස් සුරක්ෂිතතා හා සෞඛ්‍ය තත්වයන් පවත්වාගෙන යාම

- සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය පිළිබඳව පුද්ගලයන් වෘත්තීමය වශයෙන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම, වැඩබිම්වල සෑම සේවකයෙක්ම වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය සම්බන්ධයෙන් නිසිපරිදි දැනුවත් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර කාර්යයක් වුවද සියලුම වැඩබිම් වල මෙම කාර්යය සිදු කිරීම මෙම ක්ෂේත්‍රය පිළිබඳව අප ආයතනයේ මනා පුහුණුවක් ලද නිලධාරීන් විසින් සිදුකරනු ලබයි.

## කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ පණිවිඩය



වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය, ජාතික අවශ්‍යතාවයක් ලෙස මහින්ද චින්තන ප්‍රතිපත්ති මත පදනම් වූ අනාගත දැක්ම තුලින් අවධාරණය කෙරෙන කරුණක් නම් සියළු දෙනාටම සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට මඟ එලිපෙහෙලි කරන පරිසරයක් නිර්මාණය කිරීම මඟින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වා ගැනීමයි.

එබැවින් මේ සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මඟින් එම කාර්ය ඉටු කිරීමට තීරණය කර ඇත.මේ සඳහා සේවා යෝජකයන් සහ කලමණාකරණය අවධානම් අඩු වැඩ බිමක් නිර්මාණය කිරීමට සහ අවධානම් රහිත කලාපයක් ඇති කිරීමටද වගබලාගත යුතුය. කම්කරුවන් ඒ පිලිබඳ දැනුවත් කිරීමේ වගකීම සහ ඔවුන්ව ආරක්ෂා කිරීමද ඔවුන්ගේ කටයුත්තකි.

මේ සඳහාවූ වගකීම කම්කරුවන්ට පමණක් නොපැවරේ. රජයටද මේ හා සමාන වගකීමක් පැවරෙන අතර ඒ සඳහා වූ යටිතල පහසුකම් කටයුත සම්පාදනය කිරීමද රජයට පැවරි තිබෙන කාර්යයකි. නීති ප්‍රතිපත්ති හරහාද මෙම ක්‍රියාවලියට දායක විය හැකිය. මේ සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සහ සුදුසු ක්‍රමයක් ඇති කරමින් වෘත්තීය කටයුතු තුලදි සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කල හැකිය.

සේවා යෝජකයන්ට පමණක් මේ හා ලබාදෙන වගකීම පැවරෙනවා යන්න මින් අදහස් නොවන අතර ඒ හා සමාන වූ වගකීමක් රජයටද පැවරේ. මෙම ක්ෂේත්‍රය පිලිබඳ දැනුමක් සහිත පිරිස්වල ද වගකීමක් වන්නේ කම්කරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙහි කාර්යභාරය වී ඇත්තේ වැඩ කරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ඉහළ නැන්වීම සඳහා සේවක හා සේවා පක්ෂයන් දැනුවත් කිරීම තුලින් ඔවුන්ගේ සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමයි.

මේ සියළුම ප්‍රයත්නයන් සාර්ථක කර ගැනීමට කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරලීමට මුලිකත්වය සැපයු අමාත්‍යාංශය සහ ආයතනයේ කාර්ය මණ්ඩලයටද මෙහිදි කෘතඥ වෙමි.මෙම කාර්යයන්හිදි මා හා එක් වූ ත්‍රෛයිපාර්ශවීය කොටස්කරුවන් වූ සේවා, සේවක නියෝජනයන්ටද, රාජ්‍ය ආයතන, අන්තර් ජාතික කම්කරු සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධානවලටත්, මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට සියළු දිරිගැන්වීම් හා ශක්තිය ලබාදුන් මාගේ සහෝදර මැති ඇමතිවරුන්ටද මාගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

**ගාමිණී ලොකුගේ**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය



**<u>කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම්,</u>**
**<u>ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සභාපති තුමාගේ</u>**
**<u>පණිවිඩය</u>**

2014 වර්ෂයේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ අයවැය පිලිබඳ කාරක සභා අවස්ථා විවාදයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිලියෙල කරන ලද මෙම අමාත්‍යාංශය යටතට අයත් වූ ආයතනක් වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයයේ 2013 වර්ෂයේ දී ලබාගත් ප්‍රගතිය පිලිබඳ වාර්තාව මෙම ප්‍රකාශනය මඟින් ඔබ අතට පත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුලින් නිරෝගි සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකරගැනීම සඳහා ආයතනය තුල යහපත් වැඩ පරිසර තත්වයක් ඇතිකරලීමේ අරමුණින් යුක්තව පසුගිය වසරේදි කැපවීමෙන් ක්‍රියාකර තිබේ. සියළු ආකාරයේ වෘත්තීය අනතුරු වැලැක්වීමට අවශ්‍ය අධ්‍යාපනය පුහුණුව හා දැනුවත් කිරීම වැනි කාර්යයන් තුලින් නව වෘත්තීය සුරක්ෂිතතා සංස්කෘතියක් බිහිකිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය පසුගිය වසර කිහිපය තුල ඉටුකළ මෙහෙවර ප්‍රසංශනීයයි. මෙම සියළු කාර්යයන් තුලින් අප ආයතනය රටේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ කර්තව්‍යයට දායකත්වයක් සපයා තිබේ.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වූ නායකත්වය නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ අනුග්‍රහය ලබාදුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණි ලොකුගේ මැතිඳුන්ටත් මාගේ ගෞරව පූර්වක කෘතඥතාවය ප්‍රකාශ කර සිටිමි.

එමෙන්ම මෙම කාර්යය සාධනය අත්කර ගැනීමට කැපවීමෙන් සහ සහයෝගයෙන් කටයුතු කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුළු සියළු ආයතන ප්‍රධානීන්ටත් එම ආයතනනවල සියළු කාර්යය මණ්ඩල නිළධාරින්ටත් මාගේ ස්තුතිය පුදකර සිටිමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙවරක් ඉටුකළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හාසෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියළුම කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්. ජේ.එල්.යු. විජයවීර**
ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය



**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ**
**අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය**

2014 වර්ෂය සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ අයවැය පිලිබඳ කාරක සභා විවාදයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිලියෙල කරන ලද ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2013 වර්ෂයට අදාලව පිලියෙළ කරන ලද වාර්ෂික වාර්තාව ඔබ අතට පත්කරන්නේ ඉමහත් සතුටිනි.

සමාලෝචන කාලය තුළ අප ආයතනය විසින් දිවයින පුරා සිටින වැඩකරන ජනතාවට හා හාම්පුතුන් සඳහා රැකියාව ජීවිතයට තර්ජනයක් වන අවස්ථා පෙන්වා දෙමින් රැකියාව නිසා සිදුවන අනතුරු හා ලෙඩරෝග මර්ධනය කරමින් නිරෝගි ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම උදෙසා අප ආයතනය කරන ලද සේවාවන් අති මහත්ය.

ඒ අනුව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් නිරෝගි ශ්‍රම බලකායක් බිහිකිරීම උදෙසා වැඩ පරිසරයේ ආපදා තත්වයන් හඳුනාගෙන එයට අනුකූල මිනුම් ලබාගැනීම මගින් වැඩකරන පරිසරයේ ඇති විවිධ ආපදා තත්වයන්ට නිරාවරණයන් අවම කරගැනීමට ක්‍රියා කිරීම අපගේ අභිප්‍රයන් අතර මූලික වේ.

තවද වැඩබිම් තුල ඇති විවිධ නිරාවරණ නිසා ඇතිවන වෘත්තීය රෝග හඳුනාගෙන ඒවා නිරාවරණය කිරීම සඳහා ආයතනය නොපසුබටව ක්‍රියා කරයි.

වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය නගා සිටුවීම සඳහා ආයතනය මගින් විවිධ පුහුණු පාඨමාලා ඔස්සේ මෙන්ම හරවත් දේශන පවත්වමින්ද සුරක්ෂිතතා නිළධාරින් පුහුණු කිරීම මගින්ද වැඩබිමෙහි සිදුවන වෘත්තීය රෝග හා අනතුරු අවම කරමින් වැඩි ඵලදායිතාවයකු රටට ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටියි.

ඉහත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය මඟ පෙන්වීම හා අනුග්‍රහය ලබාදුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු **ගාමිණී ලොකුගේ මැතිඳුන්ට හා** කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය ලේකම් **හා** ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සභාපති**, ඩබ්ලිව්. ජේ.එල්.යූ. විජයවීර මැතිඳුන්ට කෘතඥතාවය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.**

තවද, අප හා සහයෝගයෙන් කටයුතු කළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යය මණ්ඩලය ඇතුළු ප්‍රධානීන්ට හා අප ආයතනයේ ප්‍රවර්ධනය සඳහා නොපසුබටව දායකත්වයක් ලබාදුන් මාගේ කාර්යය මණ්ඩලයටද කෘතඥතාවය පුද කරමි.


**වෛද්‍ය එන්.සී අමරසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## අධ්‍යක්ෂ මණ්ඩලය
## ජාතික වෘත්තීය සුරක්ෂතතා හා සෞඛ්‍ය ආයතනය

| | | |
|---|---|---|
| 1.ඩබ්.ජේ.එල්.යූ. විජයවීර මයා | සභාපති/ලේකම් | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය |
| 2. පී.වීරසිංහ මිය | කම්කරු කොමසාරිස් | කම්කරු හා කම්කරු සබඳතා ජනරාල් අමාත්‍යාංශය |
| 3.රවී පීරිස් මයා | අධ්‍යක්ෂ ජනරාල් | හාම්පුතුන්ගේ සංගමය |
| 4.ඩබ්ලිව් .එච්. පියදාස මයා | සභාපති | පොදු සේවක නිදහස් වෙළඳ සංගමය |
| 5.ලෙස්ලි දේවේන්ද්‍ර මයා | සභාපති | පොදු සේවක නිදහස් වෙළඳ සංගමය |
| 6.වෛද්‍ය එන්. වික්‍රමසිංහ මිය | වෘත්තීය රෝග පිලිබඳ ශේෂඥ වෛද්‍ය | ආසිරි රෝහල, නාරාහේන්පිට |
| 7.මහාචාර්ය එස්. හේරත් මිය | සමාජ විද්‍යා අංශාධිපති | සමාජ විද්‍යා අධ්‍යනපීඨය, කොළඹ විශ්ව විද්‍යාලය |
| 8.එච්.කේ. බාලචන්ද්‍ර මයා | අධ්‍යක්ෂ ජනරාල් | ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය |
| 9. ඩබ්ලිව්. එල්. එස්. විජේසුන්දර මයා | කම්කරු කොමසාරිස් | කාර්මික සුරක්ෂිතතා අංශය, මයා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය |
| 10.සී. සේනානායක මිය | කම්කරු කොමසාරිස් | ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව |


| | | |
|---|---|---|
| 11. වෛද්‍ය ඒ.ජයලාල් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රජා සෞඛ්‍ය සේවා අංශය, සෞඛ්‍ය ආරක්ෂණ හාපෝෂණ අමාත්‍යාංශය |
| 12. එච්.එච්. රුචිර විතාන මයා | ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් | කාර්මික අංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය |
| 13. වෛද්‍ය ඩී.බී. ටී.විජේරත්න මයා | කෘෂි හා කෘෂි සංවර්ධන අධ්‍යක්ෂ | කෘෂිකාර්මික හා කෘෂි සංවර්ධන අමාත්‍යාංශය |
| 14. වෛද්‍ය එන්.සී. අමරසිංහ මිය | අධ්‍යක්ෂ ජනරාල් | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය. |

**2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ පාරිසරික සමීක්ෂණ සිදු කළ සේවා ස්ථාන**



ඉහත දක්වන ලද සිතියමට අනුව අප ආයතනය විසින් සිදු කරන ලද පාරිසරික මිනුම් සමීක්ෂණයන් සිදු කල දිවයිනේ විවිධ ප්‍රදේශයන් දක්වා ඇත

# සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(සෞඛ්‍ය හා සුවස්ථතා)
අධ්‍යක්ෂ(සුරක්ෂිත තා)
සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
සහකාර අධ්‍යක්ෂ (ස්වස්ථතා)
සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරි
වෘත්තීය සුරක්ෂිතතා නිළධාරි
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ කාර්මික
සහකාර අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික්)
නීති සම්පාදක නිළධාරි
පුස්තකාලාධිපති
සම්බන්ධීකරණ නිලධාරි
කළමණාකරණ සහකාර තාක්ෂණික (2)
රියදුරු(2)
කාර්යාල සහයක (3)
කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන (8)

## <u>ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්.</u>

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය වැඩමුළු
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය වැඩමුළු
- පරීක්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිලිබද වැඩමුළු
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිලිබද වැඩමුළු
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන

- පාරිසරික සමීක්ෂණ

  - වාතයේ තත්ත්වය සමික්ෂණය කිරීම සඳහා Indoor Air Quality හා දුම් පරික්ෂා කිරීම සඳහා Flu Gas Analyzer meter උපකරණය භාවිතා කිරීම
  - කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිතා කිරීම.
  - ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීමට Sound Level Meter උපකරණය භාවිතා කිරීම.
  - උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම හා Heat Stress Meter (තාප ආතති) දර්ශකය භාවිතා කිරීම.

- වෛද්‍ය පරික්ෂණ

  - ශ්‍රවණ තත්වය මැනීමේ පරික්ෂණ
  - රුධිර විශ්ලේෂණය
  - වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම
  - පෙනහළු ක්‍රියාකාරිත්වය පිලිබඳ පරික්ෂණ
  - දෘෂ්ටි පරික්ෂණ

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ආයතනයේ සිද්ධි කළමනාකරණය සහ පරිපාලන සේවය

## 2013 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ

අප ආයතනය විසින් පවත්වාගෙන යන පුහුණු පාඨමාලාවන් පිළිබඳ විස්තර පහත වේ.

| පාඨමාලාව | කාලය | ඇතුලත්වීමට සුදුසුකම් | ඩිප්ලෝමා/ සහතිකපත්‍ර |
|---|---|---|---|
| වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | මාස 10 | අප ආයතනයේ සහතිකපත්‍ර පාඨමාලාව හදාරා තිබීම<br>පිළිගත් උපාධියක් තිබීම<br>වසර 05 ක ක්ෂේත්‍රයට අදාල පළපුරුද්ද | ඩිප්ලෝමා |
| වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | මාස 03 | උසස් පෙළ සමත් වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට | සහතිකපත්‍ර |
| කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වූ සහතිකපත්‍ර පාඨමාලාව | සති 05 | කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියක වීම | සහතිකපත්‍ර |
| වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය | මාස 03 | වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වූවන් | සහතිකපත්‍ර |

### වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් දෙකක් මෙම වසරේදී ද පවත්වන ලදි. එම පාඨමාලාවන් 2013 පෙබරවාරි මසදීත් 2013 සැප්තැම්බර් මස නව අයදුම්කරුවන් බඳවාගැනීමත් සිදු කරන ලදි. මේ සඳහා ඉහත දක්වා ඇති පරිදි පාඨමාලාවේ සුදුසුකම්වලට අනුව විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් විධායක නිලධාරින් පිලිවෙලින් 36 ක් හා 22 ක් වන පරිදි සහභාගි විය. එසේම සැප්තැම්බර් මස පාඨමාලාව වෙනුවෙන් වැඩි වශයෙන් ආරක්ෂක අංශයේ විධායක ශ්‍රේණීන්හි සේවයේ නියුතු වූවන්ගේ සහභාගිත්වය දක්නට ලැබීම විශේෂ කරුණක් ලෙස දැක්විය හැක.

අප විසින් මෙම පාඨමාලාව සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදෙන අතර ඒ සඳහා එම කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකාවන් දෙකක් සඳහාද සහභාගි කරවීම මෙම පාඨමාලාවේ තවත් අංගයකි. ඒ සඳහා මෙම වසරේ පෙබරවාරි මස ආරම්භක පාඨමාලාවේ සිසුන් කොළඹ ඩොක්යාර්ඩ් ආයතනයට සහ සීදූව ලෝර්ඩ්ස්ටාර් ආයතනයට ක්ෂේත්‍ර චාරිකාව සඳහා යොදාගන්නා ලදි.

ඔවුන් මෙම පාඨමාලාව ඉතාමත් සාර්ථක ලෙස අවසන් කල අතර අනෙක් කණ්ඩායම ලබන වසරේ මුල් භාගය අවසන් වන විට පාඨමාලාව අවසන් කිරීමට නියමිතය. පාඨමාලාව හැදෑරීම තුළින් ලද පුහුණුවෙන් තම සේවා ස්ථානයන්වල වඩාත් සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කර ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන අතර ඒ තුළින් වැඩකරන සේවකයන්ගේ ආරක්ෂාවට මනා පිටුවහලක් වී ඇත.

එසේම වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් ලෙස විවිධ ක්ෂේත්‍රයන්ට මහඟු දායකත්වයක් ලබාදීමට හැකි පිරිසක් අප ආයතනය තුළින් බිහිකර ඇත. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශීය රැකියා වලට යොමුවීම සඳහා සුදුසුකමක් වන අතර මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් විදේශීය රටවල සේවා නියුක්තව සිටියි.





### ✦ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

2013 වර්ෂයේදි වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් දෙකක් පවත්වන්නට යෙදුනි. මෙම එක් පාඨමාලාවක කාලසීමාව සති 15කි. මෙහි එක් පාඨමාලාවක් සඳහා සිසුන් 17 දෙනෙකු සහභාගි වූ අතර අනෙක් කණ්ඩායම සඳහා සිසුන් 25 දෙනෙකු සහභාගි වන ලදි.

ඔවුන් සියළුදෙනාම සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන ලද අතර මේ තුළින් මෙම පුහුණු නිළධාරින්ගේ සේවා ස්ථාන තුල වෘත්තීය අනතුරු අවම කර ගැනීමට පිටුවහලක් වී ඇත. මේ වනවිට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිළධාරින් ලෙස දැනට සේවයේ යෙදි සිටිති.

### ✦ කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වු සහතිකපත්‍ර පාඨමාලාව

මෙරට වැඩකරන ජනතාවගේ සුරක්ෂිතතාවය වෙනුවෙන්ම ස්ථාපිත කරන ලද කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මඟින්ද මෙරට වෙසෙන වැඩකරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිලිබඳව සොයාබලා ඩැඩකරන ආයතනයක් ලෙස මේ වන විට ප්‍රචලිත වෙමින් පවතී. එබැවින් අප ආයතනය නිෂ්පාදන, ඇඟළුම්, වැවිලි ක්ෂේත්‍රයන් පිලිබඳව පවත්වන පාඨමාලා මෙන්ම නිතරම රෝගීන් හා ගැටෙන සෞඛ්‍ය ක්ෂේත්රයේ ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කරන කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙද වෘත්තිකයන් සඳහාද පාඨමාලාවක් ආරම්භ කරන්නට අප තීරණය කරන ලදි. එහි පළමු කණ්ඩායම පසුගිය වසරේදි සාර්ථකව මෙම පාඨමාලාව අවසන් කරන ලද අතර 2013 වර්ෂයේදි එනම් මෙම වසරේදි 02 වන කණ්ඩායමද බඳවාගන්නා ලදි. 2013 අප්‍රෙල් මස 03 වන දින ආරම්භ කරන ලද මේ සඳහා එම ක්ෂේත්‍රය නියෝජනය කරමින් හෙදියන් 07 දෙනෙකුගේ සහභාගිත්වය තිබූ අතර සති 05ක කාලසීමාවකින් පසුව 02 වන කණ්ඩායමද සාර්ථක ලෙස පාඨමාලාව අවසන් කරන ලදි.





### ✦ වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය

වැවිලි ක්ෂේත්‍රය සඳහා වන වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව 2013 වර්ෂයේදීද  වැවිලි ක්ෂේත්‍රයේ විධායක නිළධාරින් විසිහය දෙනෙකු ලියාපදිංචි වී මාස 3ක පුහුණු කාල සීමාවක් තුලදි මෙම පාඨමාලාව ඉතාමත් සාර්ථකව නිම කරන කරන ලදි.

මෙම පාඨමාලාව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුව ඇතුලත් වන පරිදි සංවිධානය කොට තිබූ අතර පුහුණු කාල සීමාව අතරතුරදී දින දෙකක ක්ෂේත්‍ර චාරිකාවක් තුලින් ප්‍රායෝගික පුහුණුව ලබාදීමද මෙහිදි

සිදුවිය. මේ තුළින් රට තුල වැවිලි අංශයේ නියුතු වූවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය වැඩිදියුණු වීමට පිටුවහලක් වී ඇති අතර වෘත්තීය ආරක්ෂාව තුළින් කර්මාන්තශාලා ඵලදායි වශයෙන් යොදාගත් බව පුහුණුවන් පසු කරන ලද පසු විපරමේදි තහවුරු වන ලදි.










එමෙන්ම ක්ෂේත්‍රයේ උසස්වීම් ලබාගැනීමටත්, වැවිලි ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ වැඩ පරිසරය ක්‍රමානුකූලව සකස් කර ගැනීමටත් මෙම පාඨමාලාව හැදෑරීමෙන් අවස්ථාව ලැබී ඇත. එසේම " වෘත්තීය සුරක්ෂිතතා නිළධාරී" යන තනතුර හඳුනාගැනීම හේතුවෙන් ක්ෂේත්‍රය තුළ වැඩි වටිනාකමක් එයට ලැබී ඇත. සේව්‍ය සේවක දෙපක්ෂය තුලම වැඩි ඵලදායිතාවයක් ගොඩනගා ගැනීමට හැකිවීමද මෙතුලින් ලැබූ තවත් ප්‍රගතියකි. මේ වන විට මෙම පාඨමාලාව හැදෑරුවන් සඳහා වෘත්තීය මාර්ග උපදේශන අත් පොත එළිදැක්වූ අතර එය වැවිලි ක්ෂේත්‍රයේ කර්මාන්තශාලා අතර බෙදාදීමට කටයුතු කරන ලදි. තවද පාඨමාලාව අවසානයේ ලබාදෙන සහතිකයට අමතරව NVQ මට්ටමක් ලබාදීමටද කටයුතු කරමින් සිටී.

## ✦ රෝග නිර්ණ  කඳවුරු - අපනයන සැකසුම් වෙළඳ කලාපය

ශ්‍රම වාසනා අරමුදලේ මුල්‍යා අනුග්‍රහයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ මූලිකත්වයෙන් මෙම වර්ෂය පුරාවටමද දිවයිනේ ස්ථාන කිහිපයකම එනම්, බියගම, අවිස්සාවේල්ල, කොග්ගල, පල්ලකැලේ හා කටුනායක යන ස්ථානවලදී රෝග නිර්ණ කඳවුරු පවත්වන්නට යෙදුනි. මෙහිදි මූලිකව අප විසින් ශ්‍රවණ පරික්ෂාව, අක්ෂි පරික්ෂාව, රුධිර පරික්ෂාව, පෙනහළු පරික්ෂාව සිදු කරන අතර ආයතනයේ ඉල්ලීම මත දන්ත පරික්ෂාව, ක්ෂය රෝග පරික්ෂාව ආදි පරික්ෂණයන්ද සිදු කරනු ලැබූ අතර මෙම කඳවුරු සඳහා පැමිණ සිටි පිරිසට අපගේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් හා පැමිණ සිටි වෛද්‍යවරුන් විසින් ඉතා වටිනා සුරක්ෂිතතා උපදෙස් වලින් සමන්විත හරවත් දේශනයකටද සහභාගීවීමට අවස්ථාව උදා වුනි. අවසානයේදි ” Fitness Assessment” නමින් සහතිකයක්ද  අපගේ ආයතනය විසින් මෙම සියළු රෝග නිර්ණ කඳවුරු සඳහා සහභාගි වූවන් වෙනුවෙන් ප්‍රධානය කරන ලදි. මෙයද අපගේ වටිනාවු මෙන්ම ඉතා සාර්ථක වාර්ෂික ක්‍රියාකාරකමක් ලෙසද හැඳින්විය හැකි වේ. මෙහිදී තෝරාගත් සේවක සේවිකාවන් සඳහා නොමිලයේ ඇස් කණ්ණාඩි ලබාදීමද ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍යා අනුග්‍රහයෙන් සිදු කෙරිනි.









එම කඳවුරු පිලිබඳ විස්තර  පහත දත්ත ලේඛනයන් මඟින් ඔබට වඩාත් පැහැදිලි ලෙස දක්වා ඇත.

**2013 වර්ෂයේ පවත්වන ලද රෝග නිර්ණ කඳවුරු - *වගුව (අ) -***


| | **පැවැත්වූ ස්ථානය** | **සහභාගී වූ පිරිස** |
|---|---|---|
| 2013.03.21 | බියගම<br>Export processing Zone | 250 |
| 2013.04.30 | අවිස්සාවේල්ල<br>Export processing Zone | 200 |
| 2013.06.03 | කොග්ගල<br>Export processing Zone | 200 |
| 2013.09.06 | පල්ලෙකැලේ<br>Export processing Zone | 119 |
| 2013.10.07 | කටුනායක<br>Export processing Zone | 120 |

ඉහත  දත්ත ලේඛනය මඟින් දක්වා ඇත්තේ මෙම වර්ෂය පුරාවට දිවෙන පරිදි අපගේ රෝග නිර්ණ කඳවුරු පවත්වන්නට යෙදුනු කාල වකවානුන්, පැවැත්වූ ස්ථානයන් මෙන්ම සහභාගී වූ පිරිසේ ප්‍රමාණයන් ආදිය පිලිබඳ විස්තර වේ.

**2013 වර්ෂය තුළ රෝග නිර්න කඳවුරු පරීක්ෂණ දත්ත වාර්තාව - *වගුව (ආ) -***

| **පරීක්ෂාව** | **බියගම** | | | **අවිස්සාවේල්ල** | | | **කොග්ගල** | | | **පල්ලෙකැලේ** | | | **කටුනායක** | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සහභාගී පිරිස | දෝෂ සහිත | % | සහභාගී පිරිස | දෝෂ සහිත | % | සහභාගී පිරිස | දෝෂ සහිත | % | සහභාගී පිරිස | දෝෂ සහිත | % | සහභාගී පිරිස | දෝෂ සහිත | % |
| **අක්ෂි** | **80** | **55** | **69** | **120** | **60** | **50** | **65** | **63** | **97** | **109** | **92** | **84** | - | - | - |
| **ශ්‍රවණ** | **43** | **01** | **02** | **33** | **02** | **06** | **31** | **03** | **10** | **50** | **02** | **04** | **114** | **03** | **03** |
| **පෙනහළු** | **85** | **12** | **14** | **35** | **06** | **17** | **35** | **08** | **23** | **75** | **25** | **33** | **115** | **32** | **28** |
| **රුධිර** | **25** | **03** | **12** | **29** | **08** | **28** | - | - | - | - | - | - | - | - | - |
| **ක්ෂය රෝග** | - | - | - | - | - | - | - | - | - | - | - | - | **90** | **10** | **11** |
| **දන්ත** | - | - | - | - | - | - | - | - | - | - | - | - | **111** | **42** | **38** |
| **එකතුව** | **233** | **71** | | **217** | **76** | | **131** | **74** | | **234** | **119** | | **430** | **87** | |

ඉහත දත්ත වගුව *වගුව (ආ)* තුල 2013 වර්ෂය තුල දි පවත්වන ලද රෝග නීර්ණ කඳවුරු පරික්ෂණයන් පිලිබඳ දත්තයන් අන්තර්ගත වන අතර මෙහිදි වැඩිම පිරිසකගේ පරික්ෂණයන් සිදු කොට ඇත්තේ කටුනායක අපනයන සැකසුම් කලාපය තුල සිදු කරන ලද රෝග නීර්ණ කඳවුරෙහිදීය. එසේම ඉහත වගුව තුල දැක්වෙන සංඛ්‍යා දත්තයන් වනුයේ එක් එක් රෝග පරික්ෂණයන් සඳහා සහභාගි වූ පිරිස, හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව සහ හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව සහභාගී වූ පිරිසේ ප්‍රතිශතයක් ලෙස වන පරිද්දෙනි. තවද, එම විස්තර පහත ලෙසද දැක්විය හැක.




**නොමිලයේ පවත්වන්නට යෙදුන රෝග නීර්ණ කඳවුර**

මහනුවර දිස්ත්‍රික්කයේ තේ වතුයාය මුල් කරගෙන එහි සේවය කරන දමිළ ජනතාව සඳහා 2013 වර්ෂයේදී අප ආයතනය විසින් **මඩොල්කැලේ** පවත්වන ලදි. රෝග නීර්ණ කඳවුර සඳහා **පූර්ණ මූල්‍ය අනුග්‍රහය සපයන ලද්දේ අප ආයතනය** විසිනි. එනම් නොමිලයේ පවත්වන්නට යෙදුන මෙම කඳවුර සඳහා 200 ක පමණ පිරිසක් සහභාගි වූ අතර මොවුන් සඳහාද, අක්ෂි පරික්ෂාව, ක්ෂය රෝග පරික්ෂාව සහ දන්ත පරික්ෂාව යන පරික්ෂණයන් සිදු කරන ලදි. තවද, මෙහිදි හඳුනාගන්නට යෙදුන අක්ෂි රෝගීන් සඳහා ඇස් කණ්ණාඩි යුගල 90 ක පමණ ප්‍රමාණයක් නොමිලයේ ලබාදෙන්නට ද යෙදුනි.





### ✦ <u>මෙම වසරේ පවත්වන ලද පුහුණු වැඩමුළු</u>

**කොළඹ ප්‍රදේශය මුලික කරගෙන පවත්වන ලද අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය යටතේ කොළඹ නගර සභාවේ ජලනළ පද්ධතිවල සේවය කරන ඉංජිනේරුවරුන්හට වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිලිබඳ දැනුවත් කිරීමේ දින 05ක වැඩමුළුවක් පෙබරවාරි 12 වන දින ආරම්භ කරන්නට යෙදුන අතර එදින සිට දින 05 ක කාලයක් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදි පවත්වන ලදි.





මේ සඳහා නිළධාරින් 20 දෙනෙකු පමණ සහභාගි වු අතර මෙහිදි ඊකියාවෙහි යෙදෙන ස්ථානයේ පරිසරය හා එම ශ්‍රමිකයන්ගේ ඊකියාවෙහි ස්වභාවය අනුව ඔවුන්හට ඇතිවිය හැකි රෝගී තත්වයන් මැඩලීමට නිවැරදි සුරක්ෂිත ක්‍රම හා උපදෙස් ලබාදීමත් අවදානම් තත්වයන් මුදාහැර නිවැරදි ක්‍රම උපක්‍රම යොදා ගනිමින් සාර්ථක ලෙද වැඩ රාජකාරීන්හි නිරත කරවීමෙන් ඔවුන්ගේ ඊකියාවේ ගුණාත්මකභාවයෙහි වර්ධනය ඇතිකර සේව්‍ය සේවක සම්බන්ධතා තහවුරු කරමින් නිරෝගි ශ්‍රම බලකායක් ඇති කිරීම මූලික කරගනිමින් මෙම වැඩසටහන පැවැත්වීම මෙහි මූලික අරමුණ විය.

**✦ බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම**

ජාතික ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය අනුග්‍රහයෙන් හැටන් ප්‍රදේශයේ වටවල හා කැළණිවල ඇතුළුව තේ කර්මාන්තශාලාවන්හි බොයිලේරු ක්‍රියාකරවන්නන් හා ඊට සම්බන්ධ අනෙකුත් නිළධාරින්ගෙන් සමන්විත 45 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ඔවුන්ගේ වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීමේ අරමුණින් 2013.10.04 දින ස්ටැදන් පුහුණු මධ්‍යස්ථානයේහි එක් දින වැඩමුළුවක් ලෙස මෙය පවත්වන ලදි.මෙහිදී බොයිලේරු ක්‍රියාකරවීම හා භාවිතය පිලිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුමද ඉතා පුළුල් ලෙස ලබාදෙමින් ඔවුන්ව දැනුවත් කරන ලදි.

### ✦ කර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යාන වැඩසටහන

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදි හා කොළඹ ගාලුමුවදොර පිහිටි කින්ස්බරි හෝටල් පරිශ්‍රයේදි 2013 වර්ෂයේදි මෙම වැඩසටහන් 2ක් පවත්වන්නට යෙදුනි. මෙහිදි අප ආයතනය තුල පවත්වන්නට යෙදුන වැඩ අධ්‍යාන වැඩසටහන වැඩසටහනෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස ඕස්ට්‍රේලියානු මහාචාර්ය ඩේවිඩ් කේපල් මහතා සහභාගි විය. මෙහිදි එතුමා හරවත් මෙන්ම වටිනා කරුණු රැසකින් එම වැඩසටහන පවත්වන ලදි. ඊට අමතරව වෛද්‍ය එන්.සී අමරසිංහ මහත්මිය සහ රම්‍යා ජඹුරේගොඩ මෙයගේද දේශනයන් මෙම වැඩසටහනේ සාර්ථකත්වයට මහත් පිටුවහලක් විය.




- එමෙන්ම කොළඹ ගාලුමුවදොර පිහිටි කින්ස්බරි හෝටල් පරිශ්‍රයේදි පවත්වන්නට යෙදුන කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යාන වැඩසටහන සඳහා විවිධ අංශයන් නියෝජනය කරමින් නිළධාරින් සියයකගේ පමණ සහභාගි විය.මෙහිදි වැඩකරන ස්ථානයේදී ඒ අවස්ථාවන්හිදී නිවැරදි ඉරියව් පවත්වාගැනීම (Ergonomic) පිලිබඳව වැඩි ලෙස අවධානය යොමු කරවන ලදි.

## ✦ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්

- **වැඩසටහන 01**

මෙම වැඩසටහන යටතේ දිවයිනේ විවිධ ආයතනයන්හි සේවය කරන නිළධාරින් පනස් පස් දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් 2014 ක් වු මාර්තු මස දි ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදි පවත්වන ලදි. එක් දින වැඩමුළුවක් වූ මේ සඳහා විධායක ශ්‍රේණියේ වෘත්තීකයන් සහභාගි විය. සම්පත් දායකයන් ලෙස අධ්‍යක්ෂ ජනරාල්තුමිය වන එන්.සී. අමරසිංහ මහත්මිය, රම්‍යා ජඹුරේගොඩ මෙය සහ දුෂ්‍යාන්ති රන්පටිගේ **(ITI),** ෂයන් අප්පුහාමි මහතා යන මහත්ම මහත්මියන් ඔවුන්ගේ දායකත්වය ලබාදුනි.

- **වැඩසටහන 02**

මෙම ව්‍යාපෘතිය යටතේ Nor Lanka ආයතනයෙහි සේවය කරන නිළධාරින් පනස් දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් 2013 ක් වු ජුනි මස 11 වන දින දි ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේදි පවත්වන ලදි. එක් දින වැඩමුළුවක් වූ මේ සඳහා විධායක ශ්‍රේණියේ වෘත්තීකයන් 60ක් පමණ සහභාගි විය.







## ✦ වාර්ෂික ප්‍රදර්ශනය

මෙම වර්ෂයේදිද ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථාන ශාලාවේදි සැප්තැම්බර් මස පවත්වන ලද මෙඩි කෙයා 2013 සඳහා අප ආයතනයේ සහභාගිත්වයද ලබාදෙන ලදි. පුරා දින 5ක් පැවැති මෙම වැඩසටහන තුලදි අපගේ කුටිය සඳහා විශාල පිරිසක් පැමිණි අතර පැමිණි සියළුම ජනයා වෙනුවෙන් අපගේ දැනුවත් කිරීමේ කටයුතු නොමඳව සපයන්නට අප නිළධාරින් සමත්වුනි.මෙහිදි අප

බලාපොරොත්තු වූවාටත් වැඩි පිරිසකගේ අවධානය අප කුටිය සඳහා ලබාගැනීමට හැකි වූ අතර එහිදී මෙරට තුල පවතින සමාගම්වල මෙන්ම විදේශික ජනතාවගේ පැසසුමටද ලක් වීමට අපට හැකිවිය. එය අප ලද තවත් භාග්‍යකි.







### ✦ වෙබ් අඩවිය එළිදැක්වීම

අප ආයතනයේ ඉදිරි කටයුතු සඳහා මහත් රුකුලක් වන ඉතාමත් වටිනා කටයුත්තක් ලෙස හැඳින්විය හැකි මෙය 2013 පෙබරවාරි මස 08 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේදි සිදු කරන ලදි. මේ සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ අමාත්‍යතුමාගේ හා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ලේකම් ඩබ්ලිව්. ජේ.එල්. යූ. විජයවීර මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේදී උත්සවත්ශ්‍රීයෙන් පවත්වන්නට යෙදුනි. මේ මඟින් ශ්‍රී ලංකාවේ වෙසෙන සේවා නියුක්තිකයන්ගේ එනම් සේව්‍ය සේවක දෙපිරිසෙහිම වෘත්තීය සුරක්ෂිතතාවය ආරක්ෂා කර ගැනීමට මෙන්ම වැඩිදියුණු කර ගැනීම සඳහාද මහත් පිටුවහලක් වනු ඇත. තවද, මෙරට මෙන්ම විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ජනතාවටද මෙම වෙබ් අඩවිය මඟින් අත්වන ප්‍රතිලාභයන් බොහෝ වේ.





## ✦ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සමුළුව

අප ආයතනය මඟින් සංවිධානය කරන ලද වැඩසටහන් අතරින් වර්ෂයේ වැඩිම බරතැබීමක් කරමින් සිදු කරන ලද විශාල වැඩසටහනක් ලෙස මෙය හැඳින්විය හැක. මෙම සතිය තුළදී අප විසින් වෛද්‍ය සායන පැවැත්වීම, ජංගම වැඩමුළු, වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැක්වීමේ වැඩසටහන් මඟින් වැඩකරන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා සංවිධානය කරමින් සේවකයන්ට යහපත් සේවා පරිසරයක් උදාකරදීම මෙහි මූලික අරමුණ වේ.

මෙම වසරේදී ද ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ආරම්භය සනිටුහන් කරමින් එහි සමාරම්භක උළෙල 2013 වර්ෂයේ ඔක්තෝබර් මස 09 දින ආරම්භ කරන්නට යෙදුන අතර ඒ සඳහා ප්‍රධානත්වය ගනු ලැබුවේ සංවිධානය කරන ලද ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තුමිය වන වෛද්‍ය එන්.සී. අමරසිංහ මහත්මියයි.





මෙහි ආරධිතයන් ලෙස කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් පර්ල් වීරසිංහ මහත්මියද, නිදහස් සේවක සංගමයේ සභාපති ලෙස්ලි දේවේන්ද්‍ර මහතාද, ලංකා සේවක සම්මේලනයේ අධ්‍යක්ෂ ජනරාල් රවී පීරිස් මහතාද, විශේෂ ආරාධිතයකු ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාලදිවයින් ශ්‍රී ලංකා අධ්‍යක්ෂ ඩොන්ග්ලින් ලී ( Donglin Li) සහභාගීත්වයද මේ සඳහා ලැබුණු අතර ඊට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතාද, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.ජේ.එල්.යූ. විජයවීර මහතාද, මහාචාර්ය රෝහිනි ඩී. සෙනෙවිරත්න මහත්මියද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි කුලපති වෛද්‍ය ඒ.ටී. සුරවීර මහතාද ,

සිංගප්පූරු රාජ්‍යයේ මිනිස් බල අමාත්‍යාංශයේ (Ministry of Manpower) වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හා 3M සමාගමේ කොරියානු නියෝජිත හොයි මුයුන්ග් (Hoi Muyung Jung) මහතා ආදී විශාල වූ විද්වතුන් පිරිසකගේ දේශනයන්ගෙන් මෙම සමුළුව සමන්විත විය.

✦ **මාධ්‍ය හමුව**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ හා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් ජේ එල් යූ විජයවීර මහතාගේ ප්‍රධානත්වයෙන් 2013 ක් වූ ඔක්තෝබර් මස 03 වන දින මාධ්‍ය හමුවක් පැවැත්විනි. එය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය මුල් කරගෙන පවත්වන්නට යෙදුන වැඩකරන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනකි.



මේ සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් පර්ල් වීරසිංහ මහත්මිය, කර්මාන්ත සුරක්ෂිතතා අංශ ප්‍රධානී සුජාතා විජයසුන්දර මහත්මිය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය එන්.සී. අමරසිංහ මහත්මිය මේ සඳහා සහභාගි විය. එහිදි වෘත්තීය අනතුරු අවම කරගැනීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු සබඳතා අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවරයන් සහ ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් පිලිබඳ ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය කරුණු පැහැදිලි කිරීමක් කරන ලදි.

## ✦ ඩිප්ලෝමා සහතිකපත් ප්‍රධානෝත්සවය

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ඉතාමත් සාර්ථක ලෙස නිම කරන ලද විධායක ශ්‍රේණියේ රැකියාවල නියුතු හා නියැලීමට බලාපොරොත්තු වන සුරක්ෂිතතා නිළධාරින් සඳහා ඩිප්ලෝමාධාරින් ලෙස සහතිකපත් ලබාදීමේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය මෙම වසරේ ඔක්තෝබර් මස 09 වන දින ගාලුමුවදොර පිහිටි ගලධාරි හෝටලයෙහිදි මහත් උත්කර්ෂවත් අන්දමින් සිදු කරන ලදි. එහිදි වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳව ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කරන ලද 4 වන කණ්ඩායමේ 23 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන ලදි.

මේ සඳහා ගරු ලේකම්තුමා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය - එතුමා විසින් ප්‍රධානත්වය ගනු ලැබූ මෙහි ඊට අමතරව අප ආයතනය සමඟ කටයුතු කරන සමාගම් කිහිපයකම කළමණාකරුවන් කිහිප දෙනෙකුගේම සහභාගිත්වය මේ සඳහා ලැබුනි. මෙම උත්සවයේ තවත් කැපී පෙනෙන අංගයක් වූයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පවත්වන්නට යෙදෙන පාඨමාලාවන් සඳහා සම්පත් දායකත්වය ලබාදෙන ලද දේශකවරුන් ඇගයීමටද අවස්ථාවක් කරගන්නා ලදි.



**සාරාංශය**

බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම, කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යන වැඩසටහන, **අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන,** සහතිකපත් ප්‍රදානෝත්සවය, **වාර්ෂික ප්‍රදර්ශනය, වෙබ් අඩවිය එලිදැක්වීම, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ සමුළුව,** මාධ්‍ය හමුව ඊට අමතරව විදේශිය විශ්ව විද්‍යාල සිසුන් සඳහාද හෝටල් ක්ෂේත්‍රයේ නියුතු සේවා සේවක පිරිසටද අප ආයතනය විසින් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිලිබඳ වැඩමුළු ආදි ලෙස වසර පුරා වැඩසටහන් රාශියක් පවත්වන්නට යෙදුනි.

## ✦ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ අධ්‍යනය සඳහා වූ පුස්තකාලය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේ බිම් මහලේ වෘත්තිය සුරක්ෂිතතාවය සම්බන්ධව ප්‍රයෝජනවත් පොත්පත් රාශියක් පුස්තකාලය සතුවේ. පහත සඳහන් විෂයන් පිලිබඳ පොත්පත් වාර සඟරා,පත්‍රිකා, වාර්තා, නිබන්ධන, පූර්ණ මුද්‍රණ, මොඩියුල,රසායනික ආරක්ෂණ දත්ත සටහන් පත්‍ර, දත්ත පාඨක පුවත් ලිපි ආදිය සම්බන්ධව අධ්‍යනය කරන සිසුන්ගේ පරිශීලනය සඳහා සතියේ දින වල විවෘතව ඇත.

- වෘත්තීය සෞඛ්‍යය
- කර්මාන්ත
- පාරිසරික
- මහජන
- වැඩ කිරීමට සුදුසු පරිසරය
- කාර්මික ආරක්ෂාව
- රසායනික ආරක්ෂාව
- වෘත්තීය රෝග
- කර්මාන්ත නීති සම්පාදනය
- විෂ විද්‍යාව
- ජලය සහ සනීපාරක්ෂාව

2013 වර්ෂයේදි ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය


**මගින් පාරිසරික මිනුම් හා වෘත්තිය සුරක්ෂිතතාව සඳහා සේවාවන් ලබාගත් ආයතන**

- ඇක්සස් ඉන්ජිනියරින් පුද්. සමාගම -නුගේගොඩ,හේනමුල්ල
- ඇන්ට්ලර් ෆැබ්රික් ප්‍රින්ටර්ස් පුද්. සමාගම - පිලියන්දල
- බ්රන්ඩික්ස් ඉන්ටිමේට් ඇපරල් - අනුරාධපුර,පොල්ගහවෙල,රඹුක්කන, මඩකලපුව
- බ්රන්ඩික්ස් එසෙන්ෂල් ලිමිටඩ් - හම්බන්තොට
- බ්රන්ඩික්ස් කැෂුවල් වෙයා ලිමිටඩ් - සීදූව, රිදීගම, ඒකල, ගිරිතලේ, රත්මලාන
- සිලෝන් කින්ට් ට්‍රේඩ් පුද්. සමාගම-ඇහැලියගොඩ,මහරගම,වතුරුගම
- කෝට්ස් ට්‍රේඩ්ස් එක්ස්පෝට් පුද්. සමාගම - කොළඹ 10, කොළඹ 04
- කියුපිඩ් එක්ස්පෝර්ට් පුද්. සමාගම - බලපිටිය, මාවතගම
- සිලෝන් ටී සර්විස් පුද්. සමාගම - පැලියගොඩ,
- කලර්සූන් පුද්. සමාගම - පිලියන්දල
- චයිනා හාර්බර් ඉන්ජිනියරින් සමාගම - හම්බන්තොට
- ක්‍රිස්ටල් මාර්ටින් පුද්. සමාගම - කටුනායක,ගලගෙදර
- CBL ෆෑඩ් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම - රනාල
- ඩී.එස්. ගාමන්ට් ඉන්ඩස්ට්‍රිස් පුද්. සමාගම - අත්තිඩිය
- ඩී.ඩී.සී. පුද්. සමාගම - උදම්මිට
- ඩී.වී. කම්පියුටරයිස් ලේබල් පුද්. සමාගම - ඔරුගොඩවත්ත
- BASF ලංකා පුද්. සමාගම - කොළඹ 02
- ඉලාස්ටොමෙරික් ටෙක්නොලොජීස් සමාගම - පිලියන්දල
- ඊ.බී. ක්රේසි සහ සමාගම - මිල්ලෑව
- එම්.ඩී.එක්ස්පෝට් පුද්. සමාගම - කළුතර
- EAM මැලිබන් ටෙක්ස්ටයිල් පුද්. සමාගම - දැරනියගල
- ගිත්මා එම්බ්‍රොයිඩින් පුද්. සමාගම - දෙහිවල
- HI ෆැෂන් හෝල්ඩින් පුද්. සමාගම - හෝමාගම
- හේලිස් ඇග්‍රිකල්චර් - බියගම
- හයිඩ්‍රාමිණි ගෲප් පුද්. සමාගම - කහතුඩුව,අවිස්සාවේල්ල,සීතාවක, කටුනායක
- හේලිස් MGT කිනිටින් මිල් පුද් සමාගම- නෑබඩ
- ඉන්ටර්පාස්ට් ආසියා පුද්. සමාගම - කොලොන්නාව
- ජේ.කේ. ගාමන්ට් පුද්. සමාගම - කුරුණෑගල
- ජිෆී නිෂ්පාදන SL පුද්. සමාගම - මීරිගම,කොබෙයිගනේ,පන්නල
- කොරියන් ස්පා ඇක්සසරිස් පුද්. සමාගම - රනාල
- LTL ප්‍රෝජෙක්ට් පුද්. සමාගම - කොළඹ 10
- ලිඩින් ලේඩි ඉන්ටිමේට් ලංකා පුද්. සමාගම - කටුනායක
- මොනා ප්ලාස්ටික් පුද්. සමාගම - කොළඹ 03
- මදරින් නයිට් ගාමන්ට් පුද්. සමාගම - කොළඹ 05

- නොරටෙල් ලංකා පුද්. සමාගම -     කටුනායක
- නෙල්නා ෆර්ම් පුද්. සමාගම - රන්වල
- ඔරියන්ට් ගාමන්ට් පුද්. සමාගම - මීරිජ්ජවල
- ඔරිට් ගාමන්ට් පුද්. සමාගම - සීතාවක
- ඔනෙලා ඇපරල්ස් - සීදූව
- යුනියන් ඇපරල් පුද්. සමාගම - මහරගම, සීතාවක, මාරවිල
- යුනියන් නෝර්ත් පුද්. සමාගම - යුනියන් ඉන්ඩස්ට්‍රියල් වොෂින් පුද්. සමාගම - වයික්කාල
- උපාලි කන්සියුමර් ප්‍රඩක්ට් පුද්. සමාගම - කොළඹ 13
- වී. වී. කරුණාරත්න පුද් සමාගම - කැලණිය
- ආර්.එම්. හෝල්ඩින් පුද්. සමාගම - මීගමුව
- හොල්සිම් ලංකා පුද්. සමාගම - ගාල්ල
- රෙයින්බෝ ෆැෂන් පුද්. සමාගම-ඉපලෝගම
- රිච් ලයිට් එක්ස්පෝර්ට් පුද්. සමාගම - කැකිරාව
- සුමිත්‍රා ගාමන්ට් පුද්. සමාගම - වීරකැටිය
- සුමිත්රා හසලක පුද්. සමාගම - නිට්ටඹුව, හසලක
- ස්ටයිලිෂ් කැෂුවල්වෙයා පුද්. සමාගම - කිරිල්ල,හෝමාගම
- ටෙච්ස්ටාර් පැකේජින් පුද්. සමාගම - බියගම
- ටයිමෙක්ස් ගාමන්ට් පුද්. සමාගම - මාවතගම
- යන්ග් ඇන් ඉන්ටර්නැෂනල් ලංකා පුද්. සමාගම -
- ස්ටාර් ගාමන්ට් - කටුනායක, කඩුවෙල
- රිච් ලයිට් ඇපරල් පුද්. සමාගම - රත්නපුර
- යුනියන් කෙමිකල් ලංකා සමාගම - කොළඹ 02
- ලැටෙක්ස් ප්ලාන්ට් - ජා ඇල
- වී.ටී. මැනුෆැක්චරින් පුද්. සමාගම - කොත්මලේ
- සියලිෂ් ගාමන්ට් පුද්. සමාගම - හොරණ
- එස්.කේ . යුනියන් ගාමන්ට් පුද්. සමාගම - ආනමඩුව
- ස්ක්‍රීන්ලයින් හෝල්ඩින් පුද්. සමාගම - කැළණිය
- SGI ලංකා පුද්. සමාගම - කටුනායක
- ස්ටාර් ෆැෂන් ක්ලෝතින් - කඩුවෙල

# <u>මූල්‍ය විශ්ලේෂණ 2012-2013</u>

| | 2013 | 2012 |
|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | 4,153,272.60 | 1,881,785.93 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 3,758,862.00 | 2,418,363.00 |
| වෙනත් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතා ගිවිසුම් තුලින් සපයනු ලැබු සේවා සඳහා ලබාගත් ආදායම | 5,039,475.71 | 2,765,096.66 |
| නැනෝ තාක්ෂණය ව්‍යාපෘති තුළින් ලද ආදායම | - | 490,000.00 |
| වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුළින් ලද ආදායම | 864,403.88 | 350,176.00 |
| ගොඩනැගලි කුලියට දීම තුළින් ලද ආදායම | 17,241.82 | 296,597.59 |
| වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය දිනයේදී ලද ආදායම | 401,226.92 | 252,819.83 |
| පොළී ආදායම (NIOSH සංවර්ධන අරමුදල) | 2,465,694.60 | 719,390.41 |
| වෙනත් ආදායම් | 26,766.00 | 35,658.00 |
| එකතුව | <u>16,726,943.53</u> | <u>9,209,887.42</u> |



## මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2013 දෙසැම්බර් 31 වන දිනට

**ශේෂ පත්‍රය**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | **Note 1** | 1,136,807.76 | 3,482,695.31 |
| ලැබිම් | **Note 2** | 2,329,013.15 | 723,390.91 |
| සංවර්ධන අරමුදල | | 19,253,243.90 | 10,000,000.00 |
| | | 22,719,064.81 | 14,206,086.22 |
| **ස්ථාවර වත්කම්** | | | |
| භාණ්ඩාගාර තැම්පතු | | 267,500.00 | |
| දේපල පිරියත හා උපකරණ | **Note 3** | 13,881,852.94 | 8,500,217.32 |
| ප්‍රාග්ධන වියදම් ප්‍රධාන කාර්යාලය මගින් | | - | 1,171,423.33 |
| | | 14,149,352.94 | 9,671,640.65 |
| **මුළු සංචිත** | | 36,868,417.75 | 23,877,726.87 |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවීම් | **Note 5** | 1,481,439.04 | 1,936,879.45 |
| මුළු වගකීම් | | 1,481,439.04 | 1,936,879.45 |
| | | 35,386,978.71 | 21,940,847.42 |
| **ශුද්ධ වත්කම්** | | | |
| අතිරික්ත ආදායම | **Note 4** | 33,736,978.71 | 21,940,847.42 |
| වෛද්‍ය උපකරණ පරිත්‍යාග - ජාතික වෛද්‍ය අරමුදල | | 1,650,000.00 | - |
| **මුළු ශුද්ධ වත්කම්** | | 35,386,978.71 | 21,940,847.42 |

සහතික කලේ

ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර
සභාපති
ජා.වෘ.සු.හා සෞ.ආ.

සකස් කලේ

පී.එම්.කේ.පෙරේරා
සහකාර අධ්‍යක්ෂ
ජා.වෘ.සු.හා සෞ.ආ

**ආදායම් ප්‍රකාශය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| ආදායම | **2013** | **2012** |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | 5, 639,601.93 | 7,348,623.37 |
| මෙහෙයුම් ආදායම | 16,726,943.53 | 9,209,887.42 |
| | 22,366,545.46 | 16,558,510.79 |

(-)

**වියදම්**

| | | |
|---|---|---|
| පරිපාලන වියදම් | 8,344,790.46 | 4,724,329.44 |
| මූල්‍ය වියදම් | 300.00 | |
| ක්ෂය | 1,299,406.08 | 832,301.65 |
| **මුළු වියදම්** | 9,644,496.54 | 5,556,631.09 |
| **වර්ෂයේ අතිරික්තය** | **12,722,048.92** | **11,001,879.70** |

## ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1** වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

**1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේව්‍යයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

**1.3** පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

i. හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය.
යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට ඍජුව දරන ලද පිරිවැයයි.
කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

ii. ක්ෂයවීම්

වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව ඍජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.
ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍ර සූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

iii. ස්ථාවර වත්කම්

ආයතනය ආරම්භ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් වරින්වර ඊට මාරු කර එවන ලද සමහර වත්කම් ඇතුළත් වේ. 2012 වර්ෂයේදී වත්කම් සමහරක් ඉහත වර්ෂයේ ශේෂ පත්‍රයේ සීරුමාරු කිරීම් යටතේ ප්‍රාග්ධනීකරණයකොට ක්ෂයවීම් සිදුකරන ලදී.

iv. නව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

ජාතික පදනම් ආයතනය විසින් නැනෝ තාක්ෂණික වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. 16,50,000ක් මාරුකොට තිබුණු අතර 2012.12.31 වැනි දිනට එය මිලදී නොගත් හෙයින් එම මුදල ශේෂ පත්‍රයේ උපචිත වශයෙන් දක්වා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එල්එස් /සී/එන්අයිඕඑස්එච්/<br>එෆ්ජ්/1/13/2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2014 දෙසැම්බර් 29 දින | | |

සභාපති,
ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 මාර්තු 26 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යන ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 10(5) වගන්තිය | තාවකාලික අතිරික්ත මුදල්, ඉල්ලූ විට නැවත ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ තැන්පත් කළයුතු වුවත්, ප්‍රවර්ථන වර්ෂයේ රු.12,733,876 ක අතිරික්තය තැන්පත් කර නොතිබුණි. |
| (ii) 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් දෙන ලද අනුමැතියකින් තොරව රු.9,253,244 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 103(1)(ඉ), 104(1)(අ), 104(4) සහ 105(1)(ඇ) | 2012 අප්‍රේල් 23 දින අස්ථානගත වූ ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | ආයතනයේ ඇති පුස්තකාල පොත් භාණ්ඩ සමීක්ෂණයට යොමු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | ආයතනය විසින් පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,722,049 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.11,001,880 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,720,169 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. අතිරික්තය වැඩිවීම කෙරෙහි විවිධ පාඨමාලා ආදායම සියයට 92 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 මූල්‍ය සමාලෝචනය

2012 වර්ෂයේදී ආදායම් වලට වියදම් අනුපාතය සියයට 34 ක් වුවත් එය 2013 වර්ෂයේදී සියයට 43 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර පෙර වර්ෂයට වඩා මේ වර්ෂයේ ආදායම් ඉපයීම රුපියල් මිලියන 5.8 කට ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 විධිමත් පරිදි පවරා නොගත් දේපල

ආයතන පරිශ්‍රය පිහිටුවා ඇති ඉඩම සහ ගොඩනැගිලි කම්කරු දෙපාර්තමේන්තුවට අයත් වූවක් වන අතර අදාල දේපල පවරා ගැනීමට හෝ ගිවිසුම් ගත බැදීමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරු 13ක අනුමත සේවක සංඛ්‍යාව 25ක් වන අතර වර්ෂ කිහිපයක සිට පැවති පුරප්පාඩු 15ක් පිරවීමට විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) එම පුරප්පාඩු අතරින් සෞඛ්‍ය හා ස්වස්ථතා නිලධාරීන් මෙම ආයතනයේ අරමුණ ඉටුකර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නිලධාරීන් වුවත් එම නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:1 ඡේදය ප්‍රකාරව වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 සිට ආයතනයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබූ අතර 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 පෙබරවාරි 28 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ. සැලසුම් කිරීම
ආ. මූල්‍ය කළමනාකරණය
ඇ. කාර්යමණ්ඩල පරිපාලනය
ඈ. වාහන පරිපාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)